සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) දෙවියන් වහන්සේ මිනිසා පදිංචි කළේ,
(i) පාළුකරයේය (ii) එදන් උයනේය (iii) පූර්ව දිශාවේය (iv) ගෙත්සෙමන උයනේ ය.

(02) ළමුන්ගේ ආරක්ෂාව සැපයීම වෙනුවෙන් ඇති දුරකථන අංකය වන්නේ,
(i) 1939 ය (ii) 1829 ය (iii) 1929 ය (iv) 1729 ය

(03) ජල බිඳුවක ක්‍රියාකාරීත්වය පිළිබඳව බයිබලයේ සඳහන් පොත වන්නේ,
(i) ගලාතිය (ii) ගීතාවලියය (iii) එපීසය (iv) ජෝබ්ය

(04) ගීතාවලිය 103 ගීතිකාව තුළ අඩංගු වන්නේ,
(i) ජේසුස් වහන්සේගේ සේවය ගැනය (ii) දෙවියන් වහන්සේගේ කරුණාවය
(iii) දෙවියන් වහන්සේගේ ස්ථිර ප්‍රේමයය (iv) මනුෂ්‍යයාගේ විශ්වාසය ගැනය

(05) ස්නාවක ජොහන්තුමා ''පොළොං වංශය'' කියා ආමන්ත්‍රණය කළේ,
(i) විනය ධරයන්ටය (ii) ලියන්නන්ටය
(iii) සද්දුසිවරුන්ටය (iv) පරිසිවරුන්ට හා සද්දුසි වරුන්ටය

- **අංක 06 - 10 දක්වා දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

(06) ජේසුස් වහන්සේ පාළුකරයේ ගතකළ දින ගණන පනහකි ( )

(07) ජේසුස් වහන්සේ ගෝලයන්ගේ පාද සේදුවේ මහ බ්‍රහස්පතින්දාය ( )

(08) කමාව දීමේ උතුම්ම ආදර්ශය පෙන්වා දුන්නේ ජේසුස් වහන්සේ ය ( )

(09) අන් අය සමඟ බෙදා ගැනීම යහපත් ගුණාංගයක් නොවේ ( )

(10) පේදුරු හා ජොහන් සුවකළේ උපන්දා සිට කොර මිනිසෙකි ( )

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට A කොටසේ දැක්වෙන වගන්ති හා ගැළපෙන පිළිතුර කොටසින් තෝරා යාකරන්න.**

| A | B |
|---|---|
| (11) මිනිසා විසින් දේව මැවිල්ල | යාච්ඤාවය |
| (12) දරුවන්ට සෙවන දෙන ආයතනය | සමාරිය ස්ත්‍රිය ගෙනි |
| (13) මුල් කිතුණු සභාවේ පදනම | ආරක්ෂා කළ යුතුය |
| (14) ජේසුස් වහන්සේ වතුර ඉල්ලුවේ | පොත්ය |
| (15) ''බිබ්ලියා'' යන වචනයෙහි තේරුම | SOS |

- **අංක 16 - 120 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශවල හිස්තැන තුළ දී ඇති පිළිතුර යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.**

  (එංගලන්තයේය, ශාන්ත ජෙරොම් පූජකතුමා, දාහක්, අන්සුන්තා, ක්ලෞදියස් රජු)

(16) ................................ ගේ කාලයේ ලොව පුරා සාගතයක් ඇතිවිය.

(17) බයිබලය ලියවෙන්න අවුරුදු ........................................ ගත විය.

(18) විලියම් කේරි උපත ලද්දේ ................................. ය.

(19) පැරණි ගිවිසුම ලතින් බසට පරිවර්තනය කළේ .......................................... විසිනි.

(20) මුහම්මද් නබිතුමාගේ දේශනා ........................................ නම් ග්‍රන්ථයේ පළවී ඇත.

(ලකුණු $2 \times 20 = 40$)

## II - කොටස

● පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු ලියන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) මැවිල්ල කෙරෙහි ඔබේ වගකීම් 2 ක් ලියන්න.

(ii) දෙවිඳුන්ගේ ස්ථිර ප්‍රේමය තුළ ලැබෙන වරප්‍රසාද 2 ක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේ සමඟ ගෙත්සෙමන උයනට ගිය ගෝලයන් 2 ක් ලියන්න.

(iv) ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව තුළ ඇති පොදු ලක්ෂණ 2 ක් ලියන්න.

(v) ''බැටළුවා'' හා ''එඬේරා'' ලෙස හඳුන්වන්නේ කවුරුන්දැයි ලියන්න.

(vi) මුල් කාලයේ ශුද්ධ ලියවිලි ලියා තැබූ ආකාර 2 ක් ලියන්න.

(vii) මේරි ජෝන්ස් බයිබලයක් ගැනීමට මුදල් සොයාගත් ආකාර 2 ක් ලියන්න.

(viii) හින්දු බැතිමතුන් වන්දනා කරන දෙවිවරුන් 2 ක් ලියන්න.

(ලකුණු 2 × 8 = 16)

(02) (i) අද සමාජය තුළ දරුවන්ට ඇති පීඩාවන් 2 ක් ලියන්න. (ලකුණු 02)

(ii) ළමා අයිතීන් සුරැකීම සඳහා පවතින ආයතන 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) පාසලේදී ඔබේ මිතුරාගේ හෝ මිතුරියගේ ආරක්ෂාව වෙනුවෙන් ඔබ ක්‍රියාකළ අවස්ථා 6 ක් ලියන්න. (ලකුණු 06)

(03) (i) ජේසුස් වහන්සේ කුරුසියේදී පැවසූ වදන් ගණන කීයද? (ලකුණු 02)

(ii) ජේසුස් වහන්සේ කුරුසියේදී පැවසූ වදන් 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) ඔබේ මවට, පියාට, භාරකරුවන්ට සලකන ආකාර 6 ක් ලියන්න. (ලකුණු 06)

(04) (i) කිතුනු දරුවන් වන අප යාච්ඤා කළයුතු ආකාරය පිළිබඳ ජේසුතුමා ඉගැන්වූ යාච්ඤාවේ නම කුමක්දැයි ලියන්න. (ලකුණු 02)

(ii) යාච්ඤාව පිළිබඳ ජේසුස් වහන්සේ කළ ඉගැන්වීම් 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) ඔබේ පංති කාමරයේ අවශ්‍යතා ඇති මිතුරෙකුට ඔබට කළ හැකි උපකාර 6 ක් ලියන්න. (ලකුණු 06)

(05) (i) අප එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන ස්වභාවික ව්‍යසන 2 ක් ලියන්න. (ලකුණු 02)

(ii) තම තමාගේ පුලුවන්කමේ හැටියට කරන උපකාර 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) සමාජ අවශ්‍යතා ඉදිරියේ කිතුනු දරුවෙකු ලෙස ඔබ ක්‍රියා කරන ආකාර 6 ක් ලියන්න. (ලකුණු 06)

(06) (i) කිතුනු වන්ගේ පූජනීය ග්‍රන්ථය කුමක්දැයි ලියන්න. (ලකුණු 02)

(ii) බෞද්ධ, ඉස්ලාම්, හින්දු ආගම්වල ප්‍රධාන ග්‍රන්ථ මොනවාදැයි ලියන්න. (ලකුණු 03)

(iii) කිතුනු දරුවෙකු ලෙස නත්තල සැමරීම සඳහා ඔබ කරන දේවල් 6 ක් ලියන්න. (ලකුණු 06)

(4) WWW.PastPapers.WiKi (3)



Download Term Test Papers, Short Notes From One Place!

PAST PAPERS WIKI
(4) WWW.PastPapers.WiKi (4)

Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 07 - 2023**

# ක්‍රිස්තු ධර්මය

## පිළිතුරු පත්‍රය

### I - කොටස

| | | | |
|---|---|---|---|
| (01) - (ii) | (06) - (×) | (11) - ආරක්ෂා කළ යුතුය | (16) - ක්ලෞදියස් රජු |
| (02) - (iii) | (07) - (✓) | (12) - SOS | (17) - දාහක් |
| (03) - (iv) | (08) - (✓) | (13) - යාච්ඤාව | (18) - එංගලන්තයේය |
| (04) - (iii) | (09) - (×) | (14) - සමාරීය ස්ත්‍රිය ගෙනි | (19) - ශාන්ත ජෙරොම් පූජකතුමා |
| (05) - (iv) | (10) - (✓) | (15) - පොත්ය | (20) - අන්සුන්තා |

(ලකුණු 2 × 20 = 40)

### II - කොටස

(01) (i) වර්ධනය කිරීම, පාලනය, ආරක්ෂා කිරීම, නිසි ප්‍රයෝජන ගැනීම.

(ii) නිරෝගී ජීවිතයක්, සියලු පාපයෙන් මුදන ජීවිතයක් (11 පිටුව)

(iii) ජේදුරු, යාකොබ්, යොහන්

(iv) ඉල්ලීම් හා යුතුකම්

(v) බැටළුවා - කිතුනු අප එඬේරා - ජේසුස් වහන්සේ

(vi) ගල් පුවරුවල, පැපිරස් පත්‍රවල, පදම්කළ හම්වල

(vii) දර එකතුකර විකුණා, කිකිළියන් ඇතිකර බිත්තර විකුණා (74 පිටුව)

(viii) ශිව, පත්තිනි, විෂ්ණු, කතරගම හා ගණ දෙවියන් (ලකුණු 2 × 8 = 16)

(02) (i) දුප්පත්කම නිසා ඇති වන බලපෑම්, දෙමාපිය සබඳතා දෙදරායාම, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම ආදී (3 පිටුව)

(ii) ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව, එක්සත් ජාතීන්ගේ ළමා රක්ෂණ අරමුදල (4 පිටුව)

(iii) සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 2+3+6 = 11)

(03) (i) 7 යි.

(ii) පියාණෙනි ඔවුන්ට කමාවුව මැනව ඔවුන් කරන දේ ඔවුහු නොදනිති.
ස්ත්‍රිය මෙන්න ඔබේ පුත්‍රයා මෙන්න ඔබේ මෑණියෝ සියල්ල නිමවිය. (36 පිටුව)

(iii) කීකරුවීම, උපකාර වන්ත වීම, පියවදනින් කථා කිරීම ලෙඩවූ විට ආදරයෙන් රැකබලාගැනීම
ඔවුන් මුහුණ දෙන ප්‍රශන වලදී ඔවුන්ට උදව් වීම
තනි නොකර රැක බලා ගැනීම. (36 පිටුව) (ලකුණු 2+3+6 = 11)

(2) WWW.PastPapers.WiKi (1)



Download Term Test Papers, Short Notes From One Place!

(04) (i) ස්වර්ගේ වැඩ සිටින යාච්ඤාව

(ii) කෛරාටිකයන් මෙන් නොකරන්න

මිනිසුන්ට පෙනෙන ලෙස නොකර ඇතුල් කාමරයට වැද දොර වසා අදෘශ්‍යමානව වසන ඔබේ පියාණන් වහන්සේට යාච්ඤා කරන්න.

දිගින් දිගට හිස්වචන නොදොඩන්න

(iii) සිසුවා ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 2+3+6 = 11)

(05) (i) සුනාමි, සුළි සුළං, භූමි කම්පා, නියඟ

(ii) මුදල් ආධාර ලබාදීම, ශ්‍රමයෙන් උපකාර කිරීම එකිනෙකාට සවන්දීම

(iii) බේද නොතකා ක්‍රියා කළ යුතුවේ.

හැකිතරම් සාමූහික සේවයකට එක්විය යුතුය.

අපගේ උපකාරය කිසි වාසියක් ලැබීම සඳහා නොවිය යුතුය.

ප්‍රති උපකාරයක් බලාපොරොත්තුවෙන් නොකළ යුතුය.

උපකාර කිරීමේදී මිත්‍රකම්වලට විශේෂ සැලකිල්ලක් නොදැක්විය යුතුය.

ස්තුතියක් බලාපොරොත්තු නොවී අවංකව කැපවීමෙන් සේවය කළ යුතුය. (ලකුණු 2+3+6 = 11)

(06) (i) ශුද්ධවූ බයිබලය

(ii) බෞද්ධ - ත්‍රිපිටකය

ඉස්ලාම් - කුරාණය

හින්දු - වේද ග්‍රන්ථය

(iii) සිසුවා ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න (ලකුණු 2+3+6 = 11)

PAST PAPERS WIKI

(2) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**